# <u>බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව</u>

දිනය : 2023.09.20

වේලාව : පෙ.ව. 9.30

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

මුලාසනය : ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)

## සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් (බ.ප.) |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| 04) | සිරිසෝම ලෙකුවිතාන මහතා | - | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප) |
| 05) | කේ.චම්පා එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප) |
| 06) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප) |
| 07) | චන්දන රණවීර ආරච්චි මයා | - | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.) |
| 08) | එල්.ඒ.කළුකපුආරච්චි මයා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 09) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 10) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |
| 11) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 12) | කේ.ආර්.අබේසිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 13) | ඒ.එල්.වී.අයි.ලියනරත්න මහතා | - | සහකාර ලේකම් සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප) |
| 14) | පී.පී.විජේවීර මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 15) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී |
| 16) | බී.එච්.නිල්මිණී ප්‍රියන්ති මිය | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ,(සැලසුම්) සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප) |
| 17) | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2023.0[illegible] දින පැවති ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාවයි.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | කාර්ය සාධන තරඟාවලිය සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් ආයතන 386 ක් විනිශ්වය කිරීම 2023.09.18 දින සිට ආරම්භ කිරීමට කටයුතු සූදානම් කර ඇති අතර 2023.09.20 දින අමාත්‍යාංශ කාණ්ඩයට අයත් ආයතන විනිශ්වය කිරීමේ කටයුතු ආරම්භ කරනු ලබන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් සඳහන් කරන ලදී.විනිශ්වය කිරීමට බලාපොරොත්තුවන ආයතන සඳහා දිනකට හෝ දින දෙකකට පෙර පූර්ව දැනුම් දීමකින් පසුව විනිශ්වය කිරීම සඳහා විනිශ්වය කරුවන් පැමිණෙන බවද 2023.10.31 දිනෙන් සියලුම විනිශ්වය කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තුවන බවද සඳහන් කරන ලදී.<br><br>අවසාන විනිශ්වයෙන් පසු කාර්ය සාධනය ඉහළ මට්ටමක පවතින ආයතන ඇගයීමට තිළිණ හා සහතික පත්‍ර ප්‍රධානෝත්සවය 2023 දෙසැම්බර් මස තුන්වන සතියේ පැවැත්වීමට අපේක්ෂා කරන බවත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>එසේම කාර්ය සාධනය පහළ මට්ටමක පවතින බවට හඳුනාගනු ලබන ආයතනවල කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා ද සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට තීරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 02 | ගුරු පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් සම්බන්ධව | බස්නාහිර පළාත් පාසැල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේ විභාග පැවැත්වීමට මේ වන විට සියළුම කටයුතු සූදානම් කර ඇති බවත් උසස් පෙළ විෂයන් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේ විභාගය 2023.10.07 වන දින පැවැත්වීමට නියමිත බවත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. විභාග මධ්‍යස්ථාන 33 කදී විභාගය පැවැත්වීමට නියමිත අතර දින තුනක් ඇතුළත ප්‍රශ්න පත්‍ර අධීක්ෂණය කර ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතය.ගුරු පුරප්පාඩු 639 ක් පවතින අතර 7000 කට ආසන්න ඉල්ලුම් පත්‍ර ප්‍රමාණයක් මේ වන විටත් ලැබී ඇත.ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණ සිදු කර නොවැම්බර් මස මුල් සතියේදී නව ගුරු පත්වීම් ලබා දීමට කටයුතු සූදානම් කරමින් පවතින බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.<br><br>එමෙන්ම අනිකුත් ගුරු පුරප්පාඩු 5005 ක් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට අදාළ ගැසට් නිවේදනය 2023.09.22 දින පළ කිරීමට කටයුතු සූදානම් කර ඇති අතර 2023.10.09 ඉල්ලුම් පත්‍ර භාර දීමේ අවසන් දිනය වේ. මෙම විභාගය මඟින් සුදුසුකම් ලබන පිරිස කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කරන බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් වැඩි දුරටත් කරුණු දක්වන ලදී.<br><br>මෙම ගුරු විභාගය පැවැත්වීම අත්‍යාවශ්‍ය කාර්යයක් වන බැවින් පැවැත්වීමට නියමිතව ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාග මඳක් කල් දැමීමට සිදුවන බවද ප්‍රකාශ කරන ලදී. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

<table>
<tr>
<td>03</td>
<td>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව</td>
<td>
වසර තුල ක්‍රියාත්මක කිරිම සඳහා අනුමත වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br><br>
ඒ අනුව ,
<table>
<tr><th>අමාත්‍යාංශය</th><th>අනුමත ව්‍යාපෘති</th><th>ලබාදුන් ප්‍රතිපාදන රු. මිලියන</th><th>වැයකර ඇති ප්‍රතිපාදන</th><th>මූල්‍ය ප්‍රතිශතය</th><th>භෞතික ප්‍රතිශතය</th></tr>
<tr><td>පළාත් පාලන අමාත්‍යාංශය</td><td>260</td><td>786.3</td><td>123</td><td>36%</td><td>75%</td></tr>
<tr><td>සෞඛ්‍ය අමාත්‍යාංශය</td><td>1010</td><td>*2665</td><td>-</td><td>46%</td><td>-</td></tr>
<tr><td>අධ්‍යාපන අමාත්‍යාංශය</td><td>822</td><td>2393</td><td>974</td><td>44%</td><td>-</td></tr>
<tr><td>කෘෂිකර්ම අමාත්‍යාංශය</td><td>471</td><td>941</td><td>360</td><td>-</td><td>-</td></tr>
<tr><td>ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය</td><td>456</td><td>887</td><td>421</td><td>47%</td><td>62%</td></tr>
</table>
* සෞඛ්‍ය අංශ සංවර්ධන වැය සමඟ<br>
ඒ අනුව සෑම අමාත්‍යාංශයකම භෞතික ප්‍රගතිය ඉහළ ප්‍රතිශත මට්ටමක පවතින අතර මූල්‍ය ප්‍රගතියද ඉහළ ප්‍රතිශත මට්ටමකට ළගා කර ගැනිම සම්බන්ධව උපදෙස් ලබා දෙන ලදී.<br><br>
අවිස්සාවේල්ල රෝහලේ නව ගොඩනැගිල්ල විවෘත කිරීම සම්බන්ධව සාකච්ඡා කළ අතර එය රුපියල් මිලියන 5000 ක පමණ ප්‍රතිපාදන වැයවන ව්‍යාපෘතියක් වන අතර ඒ සඳහා මෙතෙක් ඇස්තමේන්තුවක් හෝ ඉදිරිපත් කර නොමැති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් කරුණු දක්වන ලදී.ඒ පිළිබඳ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කරන ලෙසත් ඒ සඳහා ආණ්ඩුකාර ලේකම්ද සහභාගී කර ගන්නා ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>
තවද බදුරලිය බස්නැවතුම්පල ඉදිකිරිම සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා විසින් විමසීම් කරන අතර ඒ සඳහා කටයුතු ආරම්භ කිරීම සඳහා ගොඩනැගිල්ලට මුල්ගල තැබීමේ කටයුතු කඩිනමින් සූදානම් කරන ලෙසද ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>
ප්‍රතිපාදන වෙන් කිරීම හා ව්‍යාපෘති සම්බන්ධව දැනට පවතින ප්‍රගතිය පිළිබඳ දත්ත ඇතුලත් කිරීම සඳහා හදුන්වා දෙන ලද පරිගණක දත්ත පද්ධතිය ඇතැම් නිලධාරීන් විසින් අදාළ දත්ත ඇතුලත් නොකිරීමේ ගැටළුවක් පවතින බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු දක්වන ලදී.<br><br>
ඒ අනුව එම දත්ත ඇතුලත් නොකරන හා එය නිසියාකාරව සිදුකරන නිලධාරීන් පිළිබඳ තොරතුරු සමඟ අදාළ නිලධාරීන්ගේ සාකච්ඡාවක් පැවැත්වීමට සූදානම් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.
</td>
<td>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)</td>
</tr>
</table>

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 04 | භාෂා පරිවර්තකයෙකුගේ අවශ්‍යතාව සම්බන්ධව | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ භාෂා පරිවර්තන කටයුතු සඳහා ඉංග්‍රීසි හා දෙමළ භාෂා පරිවර්තකයෙකු එම කාර්යාලයේ සේවය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව සතියකට දින දෙකක් හෝ භාෂා පරිවර්තකයන් දෙදෙනෙකු තම ආයතනය වෙත යොමු කරන ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද අතර එම ඉල්ලීම ඉටු කිරීමට හැකි බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>මේවන විට දෙමළ භාෂා පරිවර්තකයන් නොමැති අතර වන බඳවා ගැනීම් සිදු කල නොහැකි බැවින් දෙමළ භාෂා පර්වර්තකයෙකු ලබා දීමේ අපහසුතාව පෙන්වා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 05 | පළාත් රාජ්‍ය කොමිෂන් සභාව සතු ලිපිද්‍රව්‍ය වර්ෂා ජලයෙන් විනාශ වීම සම්බන්ධව | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේ වන විට ජයවර්ධන පුර කෝට්ටේ මහ නගර සභාවට අයත් ජන ජය සිටි ගොඩනැගිල්ලේ ඉහළ මහලේ ස්ථාපිත කර ඇත.<br>මේ දිනවල පවතින අධික වර්ෂාපතන තත්ත්වයත් සමඟ ජලය කාන්දු වීම නිසා ලිපි ද්‍රව්‍ය රැසක් නැවත භාවිතයට ගත නොහැකි පරිදි විනාශ වී ඇති බවට පළාත් රාජ්‍ය කොමිෂන් සභා ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br><br>මේ සඳහා විසඳුමක් ලබා ගැනීම සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර ඉහළ මහලේ ස්ථාපිතව ඇති මෙම කාර්යාලය සඳහා පහත මහලක් ලබා දීම සුදුසු බව තීරණය කරන ලදී.<br><br>මේ පිළිබඳ පළාත් රාජ්‍ය කොමිෂන් සභා ලේකම් විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසත් ඒ ඉල්ලීම අනුව ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව වෙත යොමු කිරීමටත් තීරණය විය. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 06 | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධව | සමූහ ජීවිත රක්ෂණාවරණය පවත්වාගෙන යන ශ්‍රී ලංකා ජාතික රක්ෂණ සංස්ථාවේ නිලධාරීන් විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව අනුව කලින් ලබා දුන් ප්‍රතිලාභ ඒ අයුරින්ම සඳහන් කර වාර්ෂික රුපියල් 1850 ක රක්ෂණාවරණ වාරික මුදලක් අයකර රක්ෂණාවරණය ලබා දීම සඳහා නිලධාරීන් 85000 ක පිරිසක් ඇතුලත් විය යුතු බව සඳහන් කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව මෙම රක්ෂණාවරණයෙන් ලැබෙන ප්‍රතිලාභ හා වාරික මුදල් ඇතුළත් කර සියලුම අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු හා ආයතන දැනුවත් කර මේ සඳහා ඇතුලත් වීමට කැමති නිලධාරීන් පිළිබඳ නියැදියක් ලබා ගැනීමටත් එය නිරීක්ෂණය කර රක්ෂණාවරණය සඳහා ඇතුලත්වන ප්‍රමාණය සැලකිල්ලට ගෙන සමූහ රක්ෂණාවරණයට ඇතුලත් විය හැකි පිරිස පිළිබඳ රක්ෂණ ආයතනය සමඟ සාකච්ඡා කිරීමට තීරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 07 | බස්නාහිර පළාත් සභාවට අයත් කාර්යාල පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය තුල ස්ථාපිත කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් කුලී පදනම මත පවත්වාගෙන යන කාර්යාල පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරිමට අදාළ මූලික කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.ඒ අනුව අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය පවත්වාගෙන ගිය පරිශ්‍රයෙහි ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවත් , VIP ආපන ශාලා පරිශ්‍රයෙහි ඉඩම් කොමසාරිස් කාර්යාලයත් 9 වන මහලෙහි කොළඹ දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය ස්ථාපිත කිරීමට කටයුතු කරන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් කරුණු දක්වන ලදී.<br><br>ආපන ශාලාවේ වෙළදාම් කටයුතු එක් ස්ථානයකින් පමණක් සිදු කිරීමටත් අලෙවි ප්‍රවර්ධන කුටි හා කෙටි ආහාර වෙළඳම් කරන ආපන ශාලාව පවතින ඉඩ ප්‍රමාණය කාර්යාල ස්ථාපිත කිරීම සඳහා යොදා ගන්නා බවත් ආපන ශාලාවේ එක් කොටසක් VIP ආපන ශාලාව සඳහා වෙන් කිරීමට කටයුතු කරන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු) විසින් වැඩි දුරටත් කරුණු දක්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 08 | වාර්තාවන් විධිමත් පරිදි ඉදිරිපත් නොකිරිම හා විමර්ශන වාර්තා ඉදිරිපත් කිරිම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අනිකුත් ආයතන වලින් වාර්තාවක් ලබා ගැනීමේදී අදාළ නිරීක්ෂණ නිර්දේශ සමඟ විධිමත් පරිදි වාර්තා යොමු නොකිරීම සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් කරුණු පැහැදිලි කරන ලදී.<br><br>විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීමේදී අදාළ විමර්ශන කටයුතු ආයතනයෙන් පිට විමර්ශන නිලධාරීන් විසින් සිදුකර නිරීක්ෂණ හා නිර්දේශ සහිතව විධිමත් පරිදි සකස් කළ වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙස සියලු ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 09 | ජනාධිපති ලේකම් හා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ලිපි සඳහා කඩිනමින් ප්‍රතිචාර නොදැක්වීම සම්බන්ධව | ජනාධිපති ලේකම් හා අග්‍රාමාත්‍ය ලේකම් විසින් යොමුකරන ලිපි සඳහා කඩිනමින් ප්‍රතිචාර නොදැක්වීම බහුලව නිරීක්ෂණය වන බවත් එය විධිමත්ව සිදු කිරීම සඳහා මේ වන විට කාර්යාලයන්හි සම්බන්ධීකරණ නිලධාරියෙකුද පත් කිරීමට පියවර ගෙන ඇතත් තව දුරටත් ඇතැම් අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු හා ආයතන ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වන තත්ත්වයක් දක්නට ඇති බවට ප්‍රධාන ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br><br>ජනාධිපති ලේකම් හා අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාල වලින් වැඩිම ලිපි ප්‍රමාණයක් යොමුවන පළාත් පාලන දෙපාර්තමේන්තුව හා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිචාර දැක්වීමේ දැඩි ප්‍රමාදයක් දක්නට ලැබෙන අතර එම ආයතන ප්‍රධානීන් මේ සම්බන්ධව දැනුවත් කරන ලෙසත් මේ පිළිබඳ කරුණු විමසීම සඳහා පත්කර ඇති සම්බන්ධීකරණ නිලධාරීන් තමා වෙත කැඳවන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 10 | රාජ්‍ය ගිණුම් කාරක සභා කමිටු ප්‍රශ්නාවලිය සම්බන්ධව දැනුවත් කිරීම | රාජ්‍ය ගිණුම් කාරක සභා කමිටු ප්‍රශ්නාවලිය හා ඊට අදාළ කරුණු සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ඉදිරිපත් කිරීමක් සමඟ සියලු නිලධාරීන් දැනුවත් කරන ලදී.2022 වර්ෂය සඳහා නව ආකෘතියක් මඟින් ප්‍රශ්නාවලිය ඉදිරිපත් කර ඇති බවත් 202.09.20 සිට 2023.10.20 දක්වා දත්ත ඇතුලත් කිරීමට හැකියාව ඇති බවත් දන්වන ලදී.<br><br>මෙම ප්‍රශ්නාවලිය සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) ගේ ප්‍රධානත්වයෙන් 2023.09.21 දින ප.ව 12.30 ට දැනුවත් කිරීමක් සිදු කිරීමට කටයුතු කරන බවත් , 2023.09.25 දින Zoom තාක්ෂණය ඔස්සේ දැනුවත් කිරීමක් සිදු කරන බවත් ,ඉන් අනතුරුව ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් දැනුවත් කිරීමක් සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් දක්වන ලදී.<br>සියලුම දෙපාර්තමේන්තු හා අධිකාරීවල පිළිතුරු සපයන ලද ප්‍රශ්නාවලිය අමාත්‍යංශ ලේකම්වරුන් වෙත යොමුවන අතර අමාත්‍යංශ වලින් නැවත පරික්ෂාකර බලා අඩුපාඩු ඇත්නම් අදාළ ආයතනය වෙත යොමුකර නිවැරදි කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කිරිමට කටයුතු කිරිම සුදුසු බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් යෝජනා කරන ලදී.<br><br>2022 වසර ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීමේ වගකීම එක් නිලධාරියෙකුට පවරා එම නිලධාරියා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) සමඟ සම්බන්ධ කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>තවද රාජ්‍ය ගිණුම් කාරක සභා කමිටු සම්මානයට පාත්‍රවූ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය හා පළාත් පාලන ආයතනවල අදාළ නිලධාරීන් කැඳවා මේ සම්බන්ධව ඔවුන්ට ඇගයීමක් සිදු කරන ලෙස අමාත්‍යංශ ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යංශ ලේකම්වරු |
| 11 | ප්‍රධාන ලේකම් කාර්යාලයේ රියදුරු පුරප්පාඩු පිරවීම සම්බන්ධව | ප්‍රධාන ලේකම් කාර්යාලයේ වාහන සඳහා මේ වන විටත් ප්‍රමාණවත් රියදුරන් ප්‍රමාණයක් නොමැති අතර ඉදිරියේදී රියදුරන් කිහිප දෙනෙකු විශ්‍රාම ගැනීමට නියමිත බැවින් ඉදිරියේදී පුරප්පාඩු වන රියදුරු තනතුරු සඳහා රියදුරන් යෙදවීමට ක්‍රියාමාර්ග ගැනිම සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>මේ වන විට බඳවා ගැනීම් සිදුකල නොහැකි බැවින්ද බඳවා ගන්නා ලද බහු කාර්ය සංවර්ධන සහයකයින් අතර ඒ සඳහා සුදුසු අය සිටින බැවින් ඔවුන් යොදවා එම පුරප්පාඩු පිරවීමේ හැකියාව සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br>බහු කාර්ය සංවර්ධන සහයකයින්ගේ තනතුර PL 1 වර්ගයට අයත්වන අතර රියදුරු තනතුර PL3 වර්ගයට අයත් බැවින් ඒ සඳහා පිළිතුරක් ලබා ගැනීමට දැනට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බැවින් එහි අනුමැතිය ලැබෙන තෙක් සේවා අවශ්‍යතාවය සලකා ආදේශක රියදුරන් ලෙස ඔවුන් සේවයේ යොදවා ගැනීම යෝග්‍ය බව තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 12 | ගිනි ආරක්ෂක සංඥා සම්බන්ධව | ගිනි ආරක්ෂක සංඥා නිකුත්වීම සම්බන්ධව දැනුම් දීමක් සිදු නොකිරීම හේතුවෙන් ඇතැම් අවස්ථාවල නිලධාරීන් අනවශ්‍ය පරිදි කලබලයට පත්වන අතරම ඉදිරියේදී ගින්නක් ඇතිවූ අවස්ථාවක වුව එය සැලකිල්ලට නොගැනීමේ තත්ත්වයක් ඇතිවිය හැකි බවට කරුණු සාකච්ඡා කරන ලදී.<br><br>ඒ අනුව ගිනි ආරක්ෂිත සංඥා ඉතා සංවේදී උපකරණයක් වන බැවින් කිනම් හෝ හේතුවකින් එය ක්‍රියාත්මක වීමේ හැකියාවක් පවතී.එබැවින් සංඥා නිකුත්වන අවස්ථාවන්හිදී වහාම ක්‍රියාත්මක වී යම් ස්ථානයක ගිනි අවධානමක් සහිතද සංඥා නිකුත් වීමට හේතුව කුමක්ද යන්න පැහැදිලිව හඳුනාගෙන ශබ්ද විකාශන යන්ත්‍රය මගින් ගොඩනැගිල්ලේ සියලු නිලධාරීන් දැනුවත් කිරිම සුදුසු බවට CSWP/ADM/27-80/FI/1/6 හා 2023.09.20 දිනැති ලිපිය මඟින් අදාළ පාර්ශවයන්ටද පිටපත් සහිතව වෙස්ප්‍රෝ ආරක්ෂක සේවාවේ ස්ථාන භාර කළමනාකාරිත්වය දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 13 | කාර්ය මණ්ඩල සමාලෝචනය සම්බන්ධව | කාර්ය මණ්ඩල බඳවා ගැනීම සම්බන්ධව කටයුතු කිරීම සඳහා මේ වන විට සමාලොචන මණ්ඩලයක් පත්කර ඇත.<br><br>එම සමාලෝචන මණ්ඩලය මඟින් තනතුරු අඩු කිරීමට හෝ යටපත් කිරිමට කටයුතු කල යුතු අතර නව බඳවා ගැනීම් සම්බන්ධව යෝජනා ඉදිරිපත් නොකරන ලෙසත් තනතුරු යටපත් කිරීමේදී සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරී තනතුරු ඉල්ලුම් නොකර දැනට පුරප්පාඩුව පවතින තාක්ෂණික හා වෙනත් අත්‍යාවශ්‍ය තනතුරු ඇතුලත් කිරීමටත් කඩිනමින් එය ලබා දීමටත් කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 14 | තොරතුරු මධ්‍යස්ථානය සම්බන්ධව | ස්ථාපිත කරන ලද තොරතුරු මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙතින් කරුණු විමසන ලදී.<br><br>ඒ අනුව ලබා දුන් උපකරණ තොරතුරු මධ්‍යස්ථානයේ ගබඩාකර තබන ලෙසත් එය පවත්වාගෙන යාම සඳහා වෙනම පරිගණකයක් සවිකර ඒ කටයුතු සඳහා වෙනම නිලධාරියෙකු යෙදවීමට කටයුතු කරන ලෙසත් දන්වන ලදී.<br><br>එමෙන්ම එම තොරතුරු මධ්‍යස්ථානයේම දේශගුණ වෙස්කම් අධීක්ෂණ ඒකකයද ස්ථාපිත කිරීමටත් ඊට අදාළ සියළු කටයුතු තොරතුරු මධ්‍යස්ථානය මඟින් සිදු කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 15 | නොමිලේ ඇස් කණ්නාඩි බෙදා දීම වැනි සමාජ සේවා වැඩසටහන් සම්බන්ධ | මෙවැනි සමාජ සේවා වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපතිවරුන් දැනුවත්කර ඔවුන්ගේ එකඟතාවය ඇතිව අදාළ යෝජනාවන් ලබාගෙන ක්‍රියාත්මක වීම සුදුසු බවට තීරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 16 | බස්නාහිර පළාත් සභාව සතු ඉඩම් ,ගොඩනැගිලි රජයේ නිවාස හා නිල නිවාස සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ අයිතිය යටතේ ඇති නිශ්චල දේපළ සම්බන්ධයෙන් එකී අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නිවේදනයක් ප්‍රකාශයට පත් කිරීමට ඊට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා ආකෘතියක් හඳුන්වා දී ඇති බවත් එකී ආකෘතියට අනුව ඒ ඒ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් තොරතුරු ඉදිරිපත් වී නොමැති බව ආණ්ඩුකාර ලේකම් හා ප්‍රධාන නීති නිලධාරී විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ 44 වගන්තිය යටතේ පවරා ගැනීමේ සහතිකය අධ්‍යනය කර ආකෘතියට අනුව නිවැරදිව තොරතුරු ලබා දෙන ලෙස සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරු වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>එමෙන්ම දැනට පළාත් සභාව යටතේ පවතින නිල නිවාස සම්බන්ධව කටයුතු කිරීම සඳහා කඩා ඉවත්කල යුතු නිල නිවාස හා ප්‍රතිසංස්කරණය කල යුතු නිල නිවාස පිළිබඳ තොරතුරු අමාත්‍යාංශ මට්ටමින් ලබාගෙන ඇති බවත් ඒ පිළිබඳ ගරු ආණ්ඩුකාරතුමා සමඟ පැවැත්වෙන සාකච්ඡාවට ඉදිරිපත් කර තීරණයක් ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් සඳහන් කරන ලදී.<br>තවද මීගමුව ඉංජිනේරු කාර්යාල නව ගොඩනැගිල්ලේ ඉහළ මහලය සංචාරක බංගලාවක් බවට සංවර්ධනය කිරීමට අදාළ සැලැස්ම ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති බැවින් ඒ සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට තීරණය විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 17 | අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘති සම්බන්ධව | අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘති 39 ක් සිදු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 1900 ක මුදලක් වෙන් කිරීමට සිදුවන අතර 2024 වසර සඳහා අධ්‍යාපන සැලසුම් සකස් කිරීමේදී අත්‍යාවශ්‍ය ව්‍යාපෘති හඳුනාගෙන ඉදිරිපත් කිරිමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් ප්‍රකාශ කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය |
| 18 | ඉංජිනේරු අංශයේ විදුලි කාර්මික පුරප්පාඩු සම්බන්ධව | ඉංජිනේරු අංශයේ පවතින විදුලි කාර්මික පුරප්පාඩු තුනක් සඳහා මේ වන විට සේවකයන් දෙදෙනෙකු යොදවා ඇති අතර එක් අයකු ඉදිරියේදී විශ්‍රාම ගැනීමට නියමිතව ඇත.ඒ අනුව විදුලි කාර්මික ශිල්පය සම්බන්ධව දැනුමක් ඇති කාර්මික ශිල්පියෙකු ඒ සඳහා යෙදවිය යුතු බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් කරුණු දක්වන ලදී.<br>ඒ අනුව බහු කාර්ය සංවර්ධන සහයකයින් අතරින් කාර්මික කටයුතු සම්බන්ධ දැනුමක් ඇති සේවකයන් එම පුරප්පාඩු පිරවීම සඳහා ආදේශක මට්ටමින් යොදවා ගැනීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 19 | වාර්ශික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | ඉල්ලුම්පත් ලැබීම ප්‍රමාද වූ බැවින් ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු නම් ලයිස්තුව ඉදිරිපත් කිරිම ප්‍රමාද වූ බවත් වාර්ෂික ස්ථාන මාරු නම් ලයිස්තුව 2023.10.01 දින වන විට නිකුත් කරන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී.<br>එමෙන්ම කළමනාකරණ සේවා නිළධාරී 750 ක් ස්ථාන මාරු කිරීමට යෝජිත අතර නියමිත දිනට එය ක්‍රියාත්මක කිරීමට සහය ලබාදෙන ලෙස සියලූ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙතින ඉල්ලා සිටින ලදී. ඒ අනුව මෙවර වැර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය අපේක්ෂිත ආකාරයටම සිදු කිරීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 20 | මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය සම්බන්ධව | මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා දත්ත ඇතුලත් කිරිමේ ප්‍රගතිය සාකච්ඡා කරන ලදී.<br><br>දැනට ඇතුලත් කර ඇති තොරතුරු අධ්‍යනය කිරීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කළ අතර ඒ අනුව එම පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සියළු අමාත්‍යංශ ලේකම්වරුන්ට හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් වෙත දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කරන ලෙස එම ආයතනයට දන්වන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br><br>දත්ත ඇතුලත් කිරීම සම්බන්ධව මසකට වරක් Zoom තාක්ෂණය ඔස්සේ රැස්වීමක් පවත්වා තමා වෙත ප්‍රගති සමාලොචන වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) වෙත උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 21 | නිවාඩු ඉල්ලුම් පත්‍ර පාලන අංශය වෙත එවීම සම්බන්ධව | ප්‍රධාන ලේකම් කාර්යාලයේ සේවය කරන නිළධාරීන්ගේ නිවාඩු ඉල්ලුම් පත්‍ර ඒ ඒ අංශ වලින් පාලන අංශ වෙත වරින් වර ඉල්ලුම් පත් යොමුකිරිම නිසා එම ඉල්ලුම් පත්‍ර ගොනු කිරීම හා අදාළ කටයුතු සඳහා ප්‍රමාදයක් සිදුවන අතර සෑම අංශයකම නිවාඩු ඉල්ලුම් පත්‍ර ඒ ඒ අංශවල ගොනුකර තබා ගැනීමටත් නිවාඩු සම්බන්ධව සාරාංශ වාර්තාවක් පමණක් සෑම මසකම අවසානයේ පාලන අංශය වෙත යොමු කිරීම සුදුසු බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව කටයුතු කිරීම සුදුසු බවත් ඉදිරියේදී එසේ සිදු කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත